# දඹුල්ල ප්‍රාදේශීය සභාව.

-------------------------------

## මාතලේ දිස්ත්‍රික්කය.

---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 ඔක්තෝබර් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කර්මාන්ත තුනකට අදාළ ණයගිමි ශේෂ එකතුව රු.2,095,644 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණු හා අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු ආයතන තුනකට අදාළව එකතුව රු.10,673,235 ක් වටිනාකම ආදායමෙන් අත්හැරී තිබුණි.

(ඇ) පෙර වර්ෂ වලට අදාළ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ආයතන 4 කට අදාළව රු.13,279,874 ක් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) වත්කම් දෙකකට අදාළව රු.9,369,158 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2015 වර්සයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණු එහෙත් නිවැරදි කර නොතිබුණු ආයතන 05 කට අදාළව රු.1,009,179 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.27,788,769 ක් වූ ගිණුම් විෂයන් 6 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.13,385,179ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

දිර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනමින් පවතින එකතුව රු.1,944,292 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම් සහ ගෙවිය යුතු රු.20,070,460 ක් වූ ගිණුම් ශේෂ 03 ක අගය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

එකතුව රු.27,838,429 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමු | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 උප වගන්ති | සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 20 දෙනෙකුගෙන් රු.132,355 ක සේවක ණය මුදලක් අයවීමට තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 572(2) | කර්මාන්ත රඳවුම් මුදල් රු.398,024 ක් ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වසර දෙකක් ඉක්මවා ඇතත් රාජ්‍ය ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේඅංක 204 | 2016 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ ඌන භාණ්ඩ 37 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,205,630 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,343,420 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,862,210 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 බදු කුලී

නිකවටවන පිහිටි මස් කඩය ලන්සු කැඳවීමකින් තොරව පෙර වර්ෂයේ බදුකරුවන්ට පෙර වර්ෂයේ බදු මුදලම වන රු.350,000 කට බදු දීමට කටයුතු කර තිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු

----------------

සභා බල ප්‍රදේශයේ පිහිටි ලංකා බැංකු හා මහජන බැංකු ශාඛා කාර්යාල දෙකෙන් වාර්ෂිකව අයකළ යුතු බදු මුදල වූ රු.3,000 ක් බැගින් ශාඛා කාර්යාල ස්ථාපිත කල දින සිට අයකර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්

------------------

සමාලෝචිත වර්ෂ අවසානයට රථ වාහන නැවතුම්පල හිඟ කුලී ලෙස ගිණුමේ දැක්වෙන රු.1,044,160 ක මුදල වසර ගණනාවක සිට ලැබිය යුතුව තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.10,545,992 ක මුදලක් සහ උසාවි දඩ ආදායම රු.625,050 ක් අයවිය යුතුව තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව කිඹිස්ස පුස්තකාලයේ පොත් 292 ක් ඌන බව සොයාගෙන තිබූ නමුත් සභාව විසින් ඒ පිළිබඳව වගකිව යුත්තන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම ද, සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති සුසාන භූමි 84 ක්ද, ප්‍රජා ශාලා 43 ක්ද, ක්‍රීඩා පිට්ටනි 13 ක්ද මිනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ ආයතන වලින් ලැබී තිබූ සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 4 ක් සභාව නමින් පවරා ගෙන නොතිබුණි.

(ඈ) දඹුල්ල තොග පොළ 1996 වර්ෂයේ ඉදිකිරීමේ කර්මාන්තයේ විවිධ අඩුපාඩුකම් මත අවසන් වාරිකය සභාව විසින් නොගෙවීම නිසා කොන්ත්‍රාත්කරු විසින් සභාවට එරෙහිව පැවරූ නඩුවේ තීන්දුව සභාවට අවාසිසහගත වීමෙන් සභා අරමුදලින් කොන්ත්‍රාත්කරුට වැඩිපුර රු.4,068,099ක මුදලක් ගෙවීමට සිදුවීම සභාවේ වගකිව යුතු නිලධාරීන් විසින් නඩුවට අදාල කරුණු නිවැරදිව ඉදිරිපත් කර නොතිබීමෙන් සහ නිසි සැලකිල්ලකින් තොරව කටයුතු කිරීමෙන් සභා අරමුදලට සිදුවූ පාඩුවක් බව නිරීක්ෂණය වූ අතර නඩු ගාස්තු ලෙස රු.685,452 ක්ද සභා අරමුදලින් දරා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

සභාව සතු JCB යන්ත්‍රය හා මාර්ග තලනය බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදීමේදී එම යන්ත්‍රය ආයතනයෙන් පිට වන විට හා නැවත පැමිණෙන විට එහි මයිලෝමීටරය පරීක්ෂා කර මනා පාලනයක් ඇති වන ආකාරයෙන් කටයුතු කර නොතිබුණු අතර කුලියට ලබාදීමේ ලේඛනයේ යෙදවූ පැය ගණන, අවශ්‍ය ස්ථානය, අවශ්‍ය සේවා ලාභියාගේ නම සඳහන් කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 2 ක් දීර්ඝ කාලයක් සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) අනතුරකට ලක්වී තිබූ කැබ් රථයක් දැනට වසර 2 ක කාලයක් අළුත්වැඩියා නොකර ගාල් කර තිබුණි.

(ඇ) භාවිතයට ගතහැකි ට්‍රැක්ටරයක් දීර්ඝ කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

3.4 හදුනාගත් අලාභ

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ නිසාන් නවාරා වර්ගයේ කැබ් රථයක් 2015 අප්‍රේල් 13 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් පත්කරන ලද කමිටුව විසින් මුදල් රෙගුලාසි 104(4) යටතේ අලාභයක් පිළිබඳ නිකුත් කරන ලද 2016 ජනවාරි 17 දිනැති අවසන් වාර්තාව අනුව එහි අලාභයේ වටිනාකම හිටපු සභාපතිගෙන් රු.7,188,851 හා රියදුරුගෙන් රු.798,761 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අනුව දම්රෝ පුටු 125 ක් හා GI බට 175 ක එකතු වටිනාකම වූ රු.170,225 ක භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) නිෂ්කාර්යව ගාල් කර තිබෙන ට්‍රැක්ටරයක් වෙනුවෙන් 2015 හා 2016 වර්ෂ සඳහා රක්ෂණාවරණ ලබාගැනීම පිණිස පිළිවෙලින් රු.39,890 ක් හා රු.39,234 ක් වැය කර තිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-------------------------

පොදු අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුලරු.500,000 කට ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ නිකවටවන බඹරගල යාය කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය වර්ෂ අවසානය දක්වා ක්‍රියාවට නංවා නොතිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් විෂයන් 12 ක් සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.852,950 ක ආදායමෙන් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 16 ක සියයට 20 සිට සියයට 90 දක්වා පරාසයක ඉලක්කගත ආදායම උපයා ගැනීමට සමත් වී නොතිබුණි.

(ඇ) ආදායම් විෂයයන් 14 ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා සියයට 15 සිට සියයට 2,679 ක් දක්වා පරාසයක ආදායම් උපයා ගෙන තිබුණි.

(ඈ) වැය විෂයයන් 29 ක් සඳහා සලසා දී තිබූ රු.383,050 ක් ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඉ) වැය විෂයයන් 57 ක ශුද්ධ ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම අතර සියයට 22 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

5 පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ඉඩම් ගොඩනැගිලි
(ආ) වාහන පාලනය
(ඇ) ගබඩා පාලනය
(ඈ) ණයගැති හා ණයහිමි
(ඉ) ගිණුම් පිළියෙල කිරීම